# ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෘත්තීය ඒකාකෘති හා රැකියා තෘප්තිය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*ඩබ්ලිව්.එම්.කේ.ඩබ්ලිව්.කේ. කරුණාරත්න [1], එච්.ඩී.පී. ප්‍රේමරත්න [2]*

රැකියා තෘප්තිය යනු කෙනෙකුගේ රැකියා අත්දැකීම් ඇගයීමේ ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයන්ට තම රැකියාව සම්බන්ධයෙන් දැනෙන තෘප්තිමත් මට්ටම වන අතර එයට සේවා පරිසරය සහ රැකියා භූමිකාවන් ගැලපීම වැනි සාධක බලපායි. ඉහල රැකියා තෘප්තිය ආයතනයේ මෙන්ම සේවක කාර්යසාධනය හා ඵලදායිත්වයට බෙහෙවින් වැදගත් වේ. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ රැකියා ඒකාකෘති යනු පුද්ගලයන්ගේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම්ව ඔවුන්ගේ භූමිකාවන් සහ ලක්ෂණ පිළිබඳ පූර්ව නිගමනයන් වේ. ඒවා රැකියා ස්ථානයේ ගතිකත්වයට, සේවකයන්ගේ අත්දැකීම් හා තෘප්තියට ද බලපායි. දැනට මේ පිළිබඳ සිදු කර ඇති පර්යේෂණ මගින් මෙම විචල්‍යයන් අතර සංකීර්ණ මෙන්ම පරස්පර සම්බන්ධතාවක් හෙළි කරයි. නමුත් බොහෝ අධ්‍යයනයන් රැකියා තෘප්තිය පුළුල් ලෙස ගවේෂණය කර ඇති අතර, රැකියා තෘප්තිය කෙරෙහි ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඒකාකෘතිවල බලපෑම තවමත් පර්යේෂණයට ලක් වී ඇත්තේ අඩු වශයෙනි. සමහර අධ්‍යයනවලින් කාන්තාවන් පිරිමින්ට වඩා ඉහළ තෘප්තිමත් මට්ටම් වාර්තා කරන අතර අනෙක් අතට වැඩ කොන්දේසි, සේවා තත්ත්වයන් සහ පුද්ගලික අපේක්ෂාවන් වැනි විවිධ සාධක පාලනය කිරීමේදී සැලකිය යුතු වෙනස්කම් නොමැති බව හෙළි කරයි. මෙම පර්යේෂණ හිඩැස ආමන්ත්‍රණය කරන අපගේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෘත්තිය ඒකාකෘති හා රැකියා තෘප්තිය අතර පවතින සම්බන්ධතාවය හඳුනා ගැනීමයි. ප්‍රමාණාත්මක අධ්‍යයන ක්‍රමවේදය මුල්කොට ගනිමින් සංඛ්‍යානමය උපක්‍රම භාවිතයෙන් සිදු කෙරුණු මෙම පර්යේෂණය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේකැලේ පිහිටි කර්මාන්ත උද්‍යානයේ සේවකයන් 260ක නියැදියක් අහඹු ලෙස තෝරා ගැනුණි. පූර්ව පරික්ෂාවකට ලක් කළ ප්‍රශ්නමාලාවක් යොදා ගනිමින් දත්ත රැස් කළ අතර දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රතිපායන විශ්ලේෂණ යොදා ගැනුණි. මෙම අධ්‍යයනයෙන් වෘත්තිය ඒකාකෘති සහ රැකියා තෘප්තිය අතර සෘණාත්මක සහ - සම්බන්ධතාවයක් පවතින බව අනාවරණය වූ අතර රැකියා ඒකාකෘති සහ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෘත්තිය ඒකාකෘතීන් අතර පැහැදිලි ලෙස සම්බන්ධතාවයක් නොමැති බව හඳුනා ගැනුනි. මෙම අධ්‍යයනය තුළින් නිගමනය කළ හැක්කේ රැකියා තෘප්තිය කෙරෙහි ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෘත්තීය ඒකාකෘති ප්‍රබල ලෙස සම්බන්ධතාවයක් පෙන්නුම් නොකරන බවයි. නමුත් ආයතනික වශයෙන් ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම තුළින් රැකියා තෘප්තිය ඉහළ නැංවිය හැකි බව යෝජනා කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** වෘත්තීය ඒකාකෘති, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය, සේවා පරිසරය, රැකියා තෘප්තිය

# කුලය යන සාධකය වර්තමානය වන විට සක්‍රීයව පවතින්නේද යන්න වීරගුල ග්‍රාමයේ මුල්කරගත් අධ්‍යයනයක්

[1] සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
kalanisocpdn@gmail.com

[2] සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
pri.hapuarachchi@arts.pdn.ac.lk